කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 ජනවාරි / පෙබරවාරි

සමාජීය විද්‍යා පීඨය

දේශපාලන විද්‍යාව - POLS - E 2025

පෙරදිග හා බටහිර දේශපාලන චින්තනයේ වර්ධනය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. දේශපාලන චින්තනයේ විෂය පථය පිළිබඳ විමර්ශනයක් කරන්න.

02. දේශපාලන චින්තනය තුළ සාකච්ඡා කරන ප්‍රධාන සංකල්පයක් වන්නේ රාජ්‍ය ආරම්භය පිළිබඳ මතවාදයන්ය. මේ පිළිබඳව ඉදිරිපත් වී ඇති අදහස් සාකච්ඡා කරන්න.

03. චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය පිළිබඳ කෙටියෙන් හඳුන්වා බෞද්ධ දේශපාලන දර්ශනයේදී ඉදිරිපත් කොට ඇති මූලික දේශපාලන මූලධර්ම මොනවාදැයි පරීක්ෂා කරන්න.

04. ප්ලේටෝ ප්‍රජාතන්ත්‍රවාදයේ සතුරෙකුය යන කියමනට ඔබට එකඟවීමට හැකිද? අදහස් දක්වන්න.

05. සිසරෝගේ දේශපාලන අදහස්වල ප්‍රධාන ලක්ෂණ හඳුන්වා රෝම යුගයේ දේශපාලන චිනත්නයට ඔහුගේ දායකත්වය විචාරාත්මකව අගය කරන්න.

06. මැකියාවෙලි නූතන ජාතික රාජ්‍යයට ලෞකික පදනමක් ලබා දීමට කටයුතු කළේය. ඔහු ඉදිරිපත් කර තිබෙන අදහස් ''කුමාරයා'' ග්‍රන්ථය ඇසුරින් විභාග කරන්න.

07. කාල් මාක්ස් ඉදිරිපත් කරනු ලැබුවේ සමාජවාදය පදනම් කොටගත් න්‍යායකි. විමසන්න.

08. චාර්ල්ස් මොන්ටෙස්ක්‍යු විසින් ඉදිරිපත් කරන ලද බලතල බෙදීමේ සිද්ධාන්තයේ න්‍යාය සහ ප්‍රායෝගිකත්වය පිළිබඳ අදහස් දක්වන්න.

09. පහත සඳහන් මාතෘකා **දෙකක්** පිළිබඳව සටහන් ලියන්න.

    අ. මහත්මා ගාන්ධිතුමාගේ 'ග්‍රාම රාජ්‍ය සංකල්පය'
    ආ. මා ඕ සේතුංගේ 'පන්ති විග්‍රහය'
    ඇ. ශාන්ත ඔගස්ටින්ගේ 'දෙවියන්ගේ නගරය'
    ඈ. ඇරිස්ටෝටල්ගේ 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය'

************************